පරිසර සම්පත් පැතිකඩ - 2025

484E සුවපුබුදුගම



සශ්‍රීකා උදයංගනී ජයසිංහ
වසම භාර සංවර්ධන නිලධාරී
484E සුවපුබුදුගම

1. හැඳින්වීම

පරිසරය හෙවත් සොබාදහම යනු තුරුලතා, සතා සිවුපාවුන්, ගංගා, ඇළ දොළ, කඳු හෙල්, තැනිතලා යන සියලු දෑ හි සංකලනයකි. මෙම සියලු සංකලනයන්ගෙන් මිහිමත ප්‍රථම ජීවියා වන්නේ ශාක බව අපි කවුරුත් දන්නා කරුණකි. ඉන්පසු ක්‍රමක්‍රමයෙන් සතුන්ද මිනිසුන්ද නිර්මාණය වී ඇති බව අපි දනිමු. හිදින් මිනිසා සහ සතුන්ගේ ජීවනාලිය වන සොබා දහම් මාතාව රැක ගැනීම කාලීන අවශ්‍යතාවයක් වී ඇති අතර එය තේමාව කර ගනිමින් හෝමාගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දියත් කරන ලද ඉතා වටිනා වූ මහඟු කර්තව්‍යයක මූලික පියවර ලෙස හෝමාගම කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ ඇති ස්වාභාවික සම්පත් හඳුනාගැනීම, ඒවා කෙතරම් දුරට භාවිතා වනවාද යන්නත්, පවතින සම්පත් උපරිමයෙන් භාවිතා කරවීමත් අරමුණු කර ගනිමින් සොබා දහමට මිනිසාගෙන් වන අහිතකර බලපෑම් අවම කිරීමත්, දැයේ අනාගත පරපුර වන අපේ දූවා දරුවන්ට පිවිතුරු සොබාදහමක් උරුම කර දීමේ අරමුණත් පෙරදැරිව වසම් මට්ටමින් මෙම පරිසර සම්පත් පැතිකඩ නිර්මාණය කිරීම සිදුකරයි.

I. මූලික තොරතුරු

a) වසම හා අංකය :- 484E සුවපුබුදුගම

b) වපසරිය (වර්ගකිලෝමීටර/අක්කර/හෙක්ටයාර මගින්)

:- වර්ගකිලෝමීටර් - 1.206 km^2

අක්කර - 298

හෙක්ටයාර - 121

c) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - හෝමාගම

d) ගොවි ජන හා කෘ.ප.නි.ස. කොට්ඨාශය - හෝමාගම

e) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - හෝමාගම

f) පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාශය - හෝමාගම

g) බීට්ටු වන කාර්යාල කොට්ඨාශය - කළුතර

h) අඩවි වන කාර්යාල කොට්ඨාශය - වග

i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශය - කොළඹ

II. ජනගහනය

- ➢ වසමේ ස්ත්‍රීන් සංඛ්‍යාව - 1693
- ➢ වසමේ පුරුෂ සංඛ්‍යාව - 1383
- ➢ වසමේ මුළු ජනගහණය - 3076
- ➢ වසමේ මුළු පවුල් සංඛ්‍යාව - 674
- ➢ වසමේ මුළු නිවාස ගණන - 684

❖ ජන වර්ග පිළිබඳ තොරතුරු

- ➢ සිංහල - 3047
- ➢ දෙමළ - 14
- ➢ මුස්ලිම් - 15



❖ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ජන සංඛ්‍යාව



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2024

III. ජනාවාසකරණයේ ස්වභාවය

වසම තුළ ජනාවාසකරණයේ ස්වභාවය ගත් කළ අභ්‍යන්තරයේ පිහිටි පවුල් තවමත් ග්‍රාමීය ජනතාව ලෙස හැඳින්විය හැකි අතර අර්ධ නාගරික ලක්ෂණ පෙන්නුම් කරන පවුල් සුළුතරයක්ද වෙති. *මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2024*

IV. දේශගුණික තොරතුරු

a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම

- උතුරු අක්ෂාංශ 6.9122
- නැගෙනහිර දේශාංශ 79.9687

b) උෂ්ණත්වය

- උපරිම 31 ℃ හා
- අවම අගය 26 ℃
- සාමාන්‍ය 28.5 ℃



මූලාශ්‍රය : Weather Spark

c) වර්ෂාපතනය

වර්ෂාපතනය වූ කලී පියවර හතරක් ඔස්සේ ආකාර හතරකින් ලංකාවට ලැබෙන අතර බස්නාහිර පළාත තුළට වර්ෂාපතනය ලැබෙනුයේ නිරත දිග මෝසම් වැසි සහ සංවහන වර්ෂාව මඟිනි. මෙහිදී දේශගුණික විපර්යාසයන්හි බලපෑම් නිසා වැසි තත්ත්වයන් වෙනස් වන අතර උපරිම වර්ෂාපතන අගය 2608 mm සිට 3000 mm දක්වා ඉහළ යන අවස්ථා ද ඇත.



මූලාශ්‍රය : Weather Spark

d) සාපේක්ෂ ආර්ද්‍රතාවය

73%



මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව)

V. පාංශු තොරතුරු

a) පසේ ස්වභාවය

පසේ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කිරීමේදී 484E සුවපුබුදුගම වසම තුළ පිහිටා ඇත්තේ ශාක හා සත්ත්ව කොටස් දිරා ගොස් ඇති වූ කළු පැහැයට හුරු බෝග වගාවට බෙහෙවින්ම හිතකර කාබනික පොහොර බහුල වූ පසකි.

b) පසේ වර්ගය

මෙම වසම තුල පසේ වර්ගය ලැටරයිට් පසට සමාන වන අතර බොහෝ විට වී වගාවට මෙන්ම පොල්, කුරුඳු, ගම්මිරිස් සේම අතුරු භෝගවලටද සුදුසු පසකි.

c) සුලභ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය)

සුලභ පාෂාණ ස්ථිත්වය සලකා බැලීමේදී ග්‍රැෆයිට්, ෆෙල්ස්පාර් ආදිය වසම තුළ නොමැති අතර ග්‍රැනයිට් තත්ත්වය යම් මට්ටමක පවතී. රබර් වගා කර ඇති යම් තරමක් විශාල වූ ඉඩම් තුළ විශාල කළුගල් පිහිටීම දැකිය හැකිය.

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය

I. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම.

II. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම.

III. පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම.

IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගිත්වය හා අවබෝධය පුළුල් කිරීම.

V. සංවර්ධන යෝජනා හඳුනා ගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම.

VI. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කර ගැනීම.

VII. අඛණ්ඩ මෙහෙයුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් ස්ථාපිත කිරීම.

3. ස්වභාවික සම්පත් පැතිකඩ

I. භෞමික සම්පත්

a) වපසරිය / භූමි ප්‍රමාණය (වර්ගකිලෝමීටර/අක්කර/හෙක්ටයාර මඟින්)

වර්ග කිලෝමීටර්	-	1.206 km2
අක්කර	-	298
හෙක්ටයාර	-	121

b) භූමි පරිහරණ සැලසුම

ඇමුණුම 01 මඟින් දක්වා ඇත. (පිටුව 34)

- කෘෂිකර්මික කටයුතු සඳහා භූමි පරිහරණය (ඇමුණුම 02) – (පිටුව 35)

i. වී - හෙක්ටයාර 11.2

ii. වෙනත් ධාන්‍ය බෝග (ඉරිගු/ මුං/කවුපි ආදිය) - හෙක්ටයාර 4

iii. අපනයන කෘෂි බෝග - *සුළු ප්‍රමාණවලින් සිදුවේ*

iv. භූමි යෙදවුම

1) ගොඩ ඉඩම් - හෙක්ටයාර 8.2

2) මඩ ඉඩම් - හෙක්ටයාර 10.4

3) පුරන් වූ හෝ අත්හැර දැමූ කුඹුරු - හෙක්ටයාර 0.4

c) පසේ ස්වභාවය හා සාඵල්‍යතාවය

පසේ ස්වභාවය හා සාඵල්‍යතාවය ඉහළ මට්ටමක පවතින අතර අපනයන වෙළඳ බෝග ගෙවතු වගා ආදී ඕනෑම තත්ත්වයකට ගැළපෙන කාබනික ස්වභාවය බහුල වශයෙන් දැකිය හැකි කළු පැහැති සරු පසක් මෙම භූමිය තුළ දැකිය හැකිය.

d) පාංශු ඛාදනයේ ස්වභාවය

පාංශු ඛාදන තත්ත්වයක් දැකීමට තරම් කුඩා හෝ කඳුකර ස්වභාවයක් මෙම වසමේ පිහිටීම තුළ නොමැති අතර පාංශ ඛාදන තත්ත්වයන් මෙතෙක් වාර්තා වී ද නොමැත.

e) පාංශු හායනයේ ස්වභාවය

පාංශු හායනය පිළිබඳව සලකා බැලීමේදී යම් යම් මිනිස් ක්‍රියාකාරකම් ; එනම් ගස් කැපීම ආදී හේතු නිසා ඉතාමත් සුළු ප්‍රමාණයෙන් බලපෑම වුවද කඳු ,හෙල් නොමැති හෙයින් ද වන වගා නොමැති හෙයින්ද කුඩා කුඩා ඉඩම් කට්ටි පිහිටීම නිසා ද පාංශු හායන තතවයක් දැකිය නොහකි තරමිය.

II. ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා කිසිවක් වසමතුල පිහිටා නොමැත.
- අතු ගංගා /ඔය/දොළවල් ද වසම තුළ පිහිටා නොමැත.
- කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා වන කුඩා ඇළ මාර්ග කීපයක් ඇත.
- වැව් / තටාක කිසිවක් වසම තුළ පිහිටා නොමැත.
- පොකුණු, නිර්මිත පොකුණු (අත්හළ ගල්වල) ද වසම තුළ පිහිටා නොමැත.
- ස්වාභාවික දිය උල්පත් ද මෙම වසම තුළ පිහිටා නැත.

b) භූගත ජලය

- ළිං - 487
- නළ ළිං - 07

මූලාශ්‍රය : Weather Spark

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යනා‍ය වර්ෂාපතනය මිලිමීටර් 2608 ක් පමණ වේ.
- වර්ෂා ක්‍රම

මැයි සිට සැප්තැම්බර් දක්වා දිගු කාලීනව බස්නාහිර පළාත තුළ නිරිත දිග මෝසම් වර්ෂාව තුළින් වැසි ලැබෙන අතර අප්‍රේල් සිට මැයි දක්වා සංවහන වැසි ද සහ ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වා අන්තර් මෝසම් වැසි ද ලැබේ.

d) වාරි මාර්ගකටයුතු

- මහා වාරි ව්‍යාපාර වසම තුළ නොමැත.
- සුළු වාරි ව්‍යාපාර වසම තුළ නොමැත.

e) ජලයේ ගුණාත්මක බව

- pH අගය
- වර්ණය
- බොරතාව

f) ජල සුලභතාවය - *සාපෙක්ෂව ප්‍රශස්ත මට්ටමක පවතී.*

III. වනාන්තර හා වන වගාවන්

සැලකිය යුතු මට්ටමින් ස්වභාවික වනාන්තර හෝ වන වගා වාර්තා නොවේ.

a) වන වැස්මේ වපසරිය (වර්ගකිලෝමීටර/අක්කර/හෙක්ටයාර මඟින්)

අදාල නොවේ.

b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

ගස් වර්ගය	ප්‍රමාණය (ආසන්න වශයෙන්)
පොල්	850
කොස්	70
දෙල්	27
අඹ	67
කෙසෙල්	1675
රඹුටන්	43
රබර්	4000
පුවක්	400

මහෝගනී	11
තේක්ක	15
පේර	30
මැංගුස්	21
ගොරකා	10
අලිපේර	14
හොර	7
කොකෝවා	4

වඳ වී යන ශාක ලේඛනය

- ★ දියපර
- ★ හීන්බෝවිටියා
- ★ තොටිල
- ★ ගොරකා
- ★ ඇත්දෙමට
- ★ වල්ලපට්ට
- ★ හිඹුටු
- ★
- ★ බැදිදෙල්
- ★ අංකෙන්ද
- ★

c) දැවමය නොවන වන නිෂ්පාදන

සැලකිය යුතු මට්ටමින් වාර්තා නොවේ.

- ආහාර හා ආකලන

ආහාර

- ★ ගම්මිරිස්
- ★ වී
- ★ පොල්
- ★ කෙසෙල්
- ★ මඤ්ඤොක්කා
- ★ එළවළු (මෑ / බෝංචි / කරිවිල / වැටකොළු / වම්බටු.....)
- ★ පලතුරු වර්ග (පේර / දොඩම් / අඹ / අන්නාසි / ගස්ලබු / රඹුටන්...)

ආකලන

★ කුරුඳු
★ රම්පේ
★ කරපිංචා
★ ඉඟුරු
★ කහ
★ සේර

- දේශීය ඖෂධ

★ ඉඟුරු
★ කහ
★ පාවට්ටා
★ නික
★ අට්ටික්කා
★ අංකෙන්ද
★ බෙලි
★ කොට දිඹුල
★ බිං කොහොඹ
★ කෝමාරිකා
★ කරපිංචා
★ මූණමල්
★ කොහොඹ
★ රණවරා,
★ බැබිල
★ හීන්බෝවිටියා
★ හාතවාරිය

- ශාකසාර (රෙසින්/තෙල්/ලාටු/මැලියම් ආදිය).
  ✓ වාර්තා නොවේ .

- අත්කම් අමුද්‍රව්‍ය (වේවැල් / හණ / පට්ට ආදිය)
  ✓ වාර්තා නොවේ.

- ඉදිකිරීම් අමුද්‍රව්‍ය
  ✓ පොල්,උණ බට,පුවක් කඳන්,ගිනිකූරු,ලුණුමිදෙල්ල ආදිය සුලබව යොදා ගනී.

- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය
  ✓ සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය ලෙස ගොක් කොළ, ක්‍රෝටන් වැනි මල් කොළ, විවිධ මල් වර්ග,විවිධ වියලි හා අමු කොළ වර්ග යොදා ගනී.

d) වන විනාශ කිරීම් පිළිබඳ විස්තර

වාර්තා නොවේ

e) වන වගා ව්‍යාපෘති විස්තර

වාර්තා නොවේ

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන්

✓ ශ්‍රී සුදර්ශනාරාම විහාර භූමිය සහ දක්ෂිණාරාම විහාර භූමිය තුළ ඖෂධ පැළ සිටුවීමක් ලෝක ළමා දිනය හා වැඩිහිටි දිනය පාදක කර ගනිමින් 2004 ඔක්තෝබර් 05 දින සිදු කරන ලදී.

✓ සුවපුබුදුගම ගොවිකාන්තා සමිතිය මගින් ගොවීන්ට හා ගෙවතු වගා කරන්නන් සඳහා ඖෂධ හා පලතුරු පැල බෙදා දීම සමිති සංවත්සර දිනයේ දී 2025 ජනවාරි 17 සිදු කරන ලදී.

- රාජ්‍ය / රාජ්‍ය නොවන / ස්වේච්ඡා සංවිධාන මගින්

රාජ්‍ය සංවිධාන යටතේ සුවපුබුදුගම වසමේ සියලු අතුරු මාර්ගයන්හි ඖෂධ හා සෙවණ සඳහා සිටුවන ශාක සිටුවීම සඳහා Clean Sri Lanka කමිටුව විසින් යෝජනා කරන ලදී.

IV. ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය (විශේෂය වශයෙන්)

★ කොස්	★ මොර	★ හොර
★ දෙල්	★ ගොරකා	★ ඇඹරැල්ලා
★ පොල්	★ කටු අනෝදා	★ තල
★ මැහෝගනී	★ අලි පේර	★ කැහැටු
★ තේක්ක	★ කොහොඹ	★ පලු
★ කුඹුක්	★ රබර්.	★ අරලිය
★ අඹ	★ රඹුටන්	★ බෙලි
★ නා	★ ගම්මාලු	

b) ශාක වර්ගීකරණය (දේශීය / ඒකදේශීය / හඳුන්වා දුන් විදේශීය හෝ දේශීය / ස්වාභාවිකෘති විදේශීය හෝ දේශීය / ආගන්තුක / ආගන්තුක ආක්‍රමණශීලී වශයෙන්)

<u>දේශීය ශාක</u>	<u>ඒක දේශීය</u>	<u>හඳුන්වා දුන් විදේශීය ශාක</u>	<u>ආක්‍රමණශීලී ශාක</u>
★ ගොරකා	★ හොර	★ රබර්	★ ගඳපාන
	★ වල්දෙල්	★ තේ	★ යෝධ නිදිකුම්බා
★ වල් අනෝදා			
★ පලු			
★ වල් දෙල්			
★ වල් ඇහැළ			
★ හීන් බෝවිටියා			
★ ඉරමුසු			

c) අන්තරායට ලක් වූ ශාක

- ★ බිං කොහොඹ
- ★ ගොඩපර
- ★ ඉරමුසු
- ★ සුදු හඳුන්
- ★ රත් හඳුන්

4. පරිසරය සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

I. කෘෂිකර්මය

a) ප්‍රධාන බෝග (වී)

වසම තුළ හෙක්ටයාර් 11.2 භූමි වපසරියක් තුළ වී වගාව ව්‍යාප්තව ඇත. (*ඇමුණුම 02*)

b) අතිරේක බෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග)

මඤ්ඤොක්කා / බතල / කිරි අල / හිඟුරල / කෙසෙල්

c) අපනයන බෝග වර්ග (තේ / පොල් / රබර්) (*ඇමුණුම 02*)

d) සුළු අපනයන බෝග / අපනයන කෘෂි බෝග (*ඇමුණුම 02*)

සාමාන්‍ය මට්ටමෙන් සිදු කෙරේ.

e) වෙනත් වාණිජ බෝග (ෆාම් / අගාවුඩ් ආදිය)

වාර්තා නොවේ.

f) රසායනික පොහොර යෙදවුම

රසායනික පොහොර යෙදවුම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී ශ්‍රී ලංකාව තුළ භූමි ප්‍රමාණයට සාපේක්ෂව හෙක්ටයාර ඒකකට 200kg – 250 kg ත් අතර පොහොර ප්‍රමාණයක් යොදනු ලබයි. . 2021 වසරේදී රසායනික පොහොර ආනයනය නතර කිරීමත් සමග ගොවිතැනේ අත්දැකීම් සම්බන්ධව ඉහළ වෙනස්කම් දක්නට ලැබුණි.



g) කෘමි පලිබෝධනාශක යෙදවුම

කෘමි පලිබෝධනාශක යෙදුම් පිළිබඳ අවධානය යොමු කිරීමේදී තේ, පොල්, රබර් සහ පළතුරු ගෙවතු වගාවන් සඳහා යම් තරමකට පළිබෝධනාශක භාවිතා කරන නමුදු මෙම වසම තුළ සෙසු වගාවන් සඳහා කෘෂිකාර්මික උපදෙස් මත සාමාන්‍යයෙන් ඒකකට පහත පරිදි පලිබෝධනාශක භාවිත කරයි.

බෝග වර්ගය	පලිබෝධනාශක යෙදවුම	ප්‍රමාණය (හෙක්ටයාරයක් සඳහා) - ලීටර් වලින්
පොල්	ඉන්සෙක්ටිසයිඩ්	2 -3 l ත් අතර
රබර්	ෆංජිසයිඩ්	3 -5 l ත් අතර
කුරුඳු	ෆංජිසයිඩ්	2 -3 l ත් අතර
පලතුරු / කෙසෙල්	ඉන්සෙක්ටිසයිඩ්, ෆංජිසයිඩ්	4 -6 l ත් අතර

ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ආයතනික භාවිතය ටොන් 45,000ක් 50,000ක් පමණ වේ. ඉන් විශාල කොටසක් ඉරිඟු හා පලතුරු සඳහා යෙදවේ.

h) සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් ලෙස ඈත අතීතයේ ගොවිතැනේ මූලික භූමිකාව ප්‍රකෘති සමාජය තුළ තිබූ සම්පත්, ගම් පහළ කුසලතා හා පරිසරය සමග ගැලපීම් මත ගොඩනැගී තිබුණි.

- ✓ ගම්වැසියන් විසින් සකසන ලද වක්කඩ, වගා ළිඳ භාවිතා කර ජලය ලබා ගැනීම.
- ✓ සත්ව මළ, ගස්වල පොතු, හරක් ඇට, කොම්පෝට් ආදිය පොහොර ලෙස භාවිතය.
- ✓ ගොවිතැනේදී සතුන්ගේ මළ පොහොර ලෙස යොදා ගැනීම.
- ✓ මිතුරු ගස් වගා කිරීමෙන් පලිබෝධ පාලනය.
- ✓ පොල් ඔලු සිටුවීම, රැලි පටි ඇදීම.
- ✓ වගාව අතරට විශාල ගස් වැවීම.

i) නවීන කෘෂිකාර්මික පිළිවෙත්

- ✓ ජලය කළමනාකරණය කිරීම සඳහ විසිරුම් හා ජල බිංදු ක්‍රමය යොදා ගැනීම.
- ✓ යන්ත්‍ර මඟින් අල සහ පැල සිටුවීම හා අසවනු නෙලීම.
- ✓ ජෛව තාක්ෂණය යටතේ හයිබ්‍රිඩ් බීජ හඳුන්වා දීම.

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත්

- ✓ රෝග වලට සහ වෙනස් වන කාලගුණයට ඔරොත්තු දෙන ආකාරයට බීජ භාවිතය.
- ✓ ටිපර් ක්‍රමය, ස්ප්‍රේ ක්‍රමය වැනි ජල සම්පාදන ක්‍රම භාවිතය.
- ✓ කාබනික පොහොර, කෙම් ක්‍රම ආදිය භාවිතය.
- ✓ ස්වාභාවික අමුද්‍රව්‍යය මඟින් පළිබෝධ විනාශ කිරීම.
- ✓ නවීන තාක්ෂණික උපකරණ භාවිතය මඟින් බෝග අවශ්‍යතා නිරීක්ෂණය කිරීම.
  උදා. - කැමරා
- ✓ බෝග විවිධාංගිකරණය කිරීම.
- ✓ වනය, භූගත ජලය, ජල මූලාශ්‍ර ආදිය ආරක්ෂා කිරීම.

k) කෘෂිකර්මාන්තය කෙරෙහි ඇතිවන අභියෝග හා දුෂ්කරතා (ස්වාභාවික ආපදා / කෘමි හා පලිබෝධක බලපෑම්)

- ✓ වියළි කාලගුණය, සුළි කුණාටු හා ගංවතුර තත්වයන්.
- ✓ බොහෝ ප්‍රදේශ වල ජල කළමනාකරණයක් නොමැති වීම තුළ ජල අර්බුධයට මුහුණ පෑම.
- ✓ බෝග සඳහා සත්ව කෘමීන් සහ නව රෝග ව්‍යාප්තිය.
- ✓ පොහොර, බීජ, කෘමිනාශක වැනි දෑ වල මිල ඉහළ යාම හේතුවෙන් වෙළඳ පොළ දුෂ්කරතා ඇතිවීම.

II. පශු සම්පත් කර්මාන්තය

a) සුලභ පශු කර්මාන්ත යෙදවුම්

	අයිතිකරුගේ නම	ගව	මීගව	එළු	කුකුළු	වෙනත්	ප්‍රතිලාභය
1	ජානක පුෂ්ප කුමාර	-	10	15	15	-	කිරි / බිත්තර
2	දමිත් මාතරගේ	4	-	8	10	-	කිරි / බිත්තර
3	රුවන් ධර්මපාල	-	-	-	15	-	බිත්තර
4	එම්. ප්‍රියන්ත	6	2	20	10	-	කිරි / බිත්තර
5	ප්‍රියන්ත රෝහණ	-	6	-	-	-	කිරි
6	එම්. දයානන්ද	-	4	-	5	-	කිරි / බිත්තර
7	සුපුන් ප්‍රභාත්	-	-	-	20	-	බිත්තර
8	නලින් මාතරගේ	-	-	-	25	-	බිත්තර
9	එම්. සිරිමල්	-	-	5	5	-	කිරි / බිත්තර
10	නලින් බුද්ධික	2	3	10	5	-	කිරි / බිත්තර
11	මනෝජ් ප්‍රියන්ත	3	2	-	-	-	කිරි
12	කුමාර රංජිත්	-	-	15	5	-	කිරි / බිත්තර
13	කේ.ඒ. චන්ද්‍රසිරි	2	2	10	-	-	කිරි

14	තනූජා සුමංගලී	-	-	5	10	-	කිරි / බිත්තර
15	සුනිල් මාතරගේ	5	-	5	-	-	කිරි
16	හර්ෂණී රුක්ෂිලා	-	-	10	-	-	කිරි
17	අජන්තා රත්නායක	-	-	10	-	-	කිරි
18	අජිත් මාතරගේ	-	3	10	-	-	කිරි
19	කුමාර ගලගෙදර	2	2	10	-	-	කිරි
20	බුද්ධික මාතරගේ	2	2	-	-	-	කිරි

b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තරය

- ✓ ස්වභාවික තණකොළ
- ✓ CO3 වගා තණකොළ
- ✓ පුන්නක්කු
- ✓ ඔමී (එළුවන් සඳහා)
- ✓ සහල් නිවුඩු
- ✓ කොස්කොළ (එළුවන් සඳහා)

c) පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය)

- ✓ කුර රෝග (එළුවන් / ගවයන් සඳහා)
- ✓ මුඛ රෝග (එළුවන් / ගවයන් සඳහා)
- ✓ උණ රෝගය (කුකුළන් සඳහා) - රැනිකට් ඖෂධය

III. ධීවර කර්මාන්තය

අදාළ නොවේ.

IV. ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව

  සූර්ය පැනල

- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව

    පෙට්‍රෝලියම් ප්‍රභව සුලබව පරිභෝජනය කෙරේ.

b) ස්වභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම් හා සැපයුම් අනුපාත විශ්ලේෂණය (ප්‍රස්තාර සහිතව)



- සැම විටම ස්වභාවික සම්පත් සීමා සහිත වන බැවින් මිනිස් අවශ්‍යතා අසීමිත බැවිනුත් සැපයුමට වඩා ඉල්ලුම ඉහළ අගයක් ගනී.

c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

එනම් සමාජයේ පුද්ගලයන්, කණ්ඩායම් සහ ආයතන එකට එක්වී මෙම ශක්ති මූලාශ්‍ර ප්‍රවර්ධනය කරන ආකාරයයි. ඒ අනුව ප්‍රජාවේ දායකත්වය දැක්විය හැකි ආකාර කීපයකි.

1) ගෘහ භාවිතය තුළ

- ✓ සූර්ය පැනල, සූර්ය උණු ජල යන්ත්‍ර භාවිතා කිරීම. (මෙම වසම තුළ ඉතාම සුළු වශයෙන් සූරිය පැනල භාවිතය වේ)
- ✓ LED බල්බ සහ ශක්ති සුරක්ෂිත උපකරණ භාවිතා කිරීම.
- ✓ විද්‍යුත් යතුරු පැදි හා වාහන භාවිතය

2) ප්‍රජා මට්ටමින්

- ✓ චක්‍රීය පරිෝජන රටාවන් දිරිමත් කිරීම
- ✓ කසල, කෘෂිකාර්මික ඉතිරි අපද්‍රව්‍ය භාවිතයෙන් ජෛව ශක්තිය භාවිතයට පෙළඹීම.

3) අධ්‍යාපන හා අවබෝධය

- ✓ ජනතාව අතර පරිසර හිතකාමී ජීවින රටාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ග්‍රාමීය වශයෙන් ස්ථාපිත ක්ලීන් ශ්‍රී ලංකා හා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සමග ඒකාබද්ධව වැඩසටහන් සැලැසුම් කිරීම.

4) පෞද්ගලික ආයෝජන හා ව්‍යාපාරික මට්ටම

- ✓ ගෘහස්ථ හා ව්‍යාපාරික ස්ථානවල හරිත ගොඩනැඟිලි (Green Buildings) නිර්මාණය කිරීම.

5) නීතිමය හා රාජ්‍ය මැදිහත්වීම මඟින්

- ✓ ජනතාවට සහන පොළී ක්‍රමයන් යටතේ සූර්ය පැනල සඳහා ණය මුදල් ලබාදීම.
- ✓ ජනතාවට නවෝත්පාදන හඳුන්වා දීම සඳහා වැඩමුළු හා සමාජ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.

5. සමාජ සංස්කෘතික සන්දර්භය

I. පරිසර ගැටලූ පිළිබඳව ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනා කරන යාන්ත්‍රණය

මෙහිදී ආකාර කීපයක් ඔස්සේ මෙය දැක්විය හැකිය. වර්තමානයේ පරිසර දූෂණය, පරිසර ආරක්ෂාව පිළිබඳව ප්‍රජාවගේ දැනුවත් වීම ඉතා ඉහල මට්ටමක පවතී.

1) ප්‍රජා මට්ටමේ යාන්ත්‍රණය (විසඳුම් යෝජනා කරන යාන්ත්‍රණය)

- ✓ ගෘහ මට්ටමෙන් කසල වර්ගීකරණය කිරීම මෙම වසමේ බොහෝ නිවෙස් වල සිදු කරනු ලබයි.
- ✓ පරිසර සුරැකුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සුවපුදූගම වසම තුළ සිදු කරනු ලබයි.
- ✓ අපද්‍රව්‍ය නැවත භාවිතය සිදු කිරීම තුළ මීට දායක විය හැකි අතර ප්ලාස්ටික් බඳුන්, පොල් ලෙළි වැනි දේ ගෙවතු වගාකරණයේදී විකල්ප බඳුන් ලෙස භාවිතා කිරීම මෙම වසම තුළදී දැකිය හැකිය.

2) රාජ්‍ය මට්ටමේ යාන්ත්‍රණය

- ✓ නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා නීති විරෝධී අය සඳහා දඬුවම් ලබාදීම.
- ✓ හරිත ශක්ති (Green Energy) හඳුන්වා දීම.

3) ප්‍රාදේශීය හා ලෝක මට්ටමේ යාන්ත්‍රණ ගම් තුළට හඳුන්වා දීම.

අධ්‍යාපන පුහුණු වැඩසටහන් මඟින් පාසැල්, විශ්ව විද්‍යාල, NGO වැඩසටහන් මඟින්, රූපවාහිනී, පුවත්පත්, සමාජ මාධ්‍ය තුළින්, පරිසරය සුරැකීම් තේමා මඟින්, පරිසරය දූෂණය වන ආකාර සහ ඒවා සුරැකිය යුතු ආකාර පිළිබඳ ප්‍රජාවගේ දැනුවත් වීම හා අවබෝධය ඉතා පුළුල් මට්ටමක පවතී.

II. සාම්ප්‍රදායික පරිසර දැනුම හා පරිවාර

සාම්ප්‍රදායික පරිසර දැණුම යනු ජීවිතය හා පරිවාරය අතර සම්බන්ධතාවය ස්ථිරව පවත්වාගෙන යාම සඳහා පරම්පරාවෙන් පරම්පරාවට කට වචනයෙන් රැගෙන එන දේශීය දැනුම, අත්දැකීම්, හඳුනාගැනීම්, ජන විශ්වාස, ආගමික රීති, ජාතික චාරිත්‍රවලින් ලැබෙන දැනුම ආදිය වේ.

උදාහරණ ලෙස සාම්ප්‍රදායික වැව නිර්මාණය කිරීමේ දී දාගැබ තැනීම, බෝ ගස, කොහොඹ, නා ආදී වෘක්ෂ හා නෙළුම් වැනි ජලජ පැළෑටි කෙරේ මිනිස්සුන්ට තිබූ ගෞරවය අදටත් පැවතීම, ගොවිතැනේ දැනුම අහස දෙස බලා වැස්ස පිළිබඳව අනාවැකි පැවසීම, ඇලේ, දෙපාවේ ජලය ගොවිතැනට බෙදා ගැනීම, කෘමි මර්දනය කිරීම, ඇවිල්කම් හා දියවැඩියාව වැළැක්වීමට භාවිතා කරන ආහාර රටා ආදිය පෙන්වා දිය හැකි අතර ඒවා වර්තමානයේදී සුවපුබුදුගම වැනි ග්‍රාම නිලධාරී වසම් වලද තවමත් දැකිය හැකිය. එනම් සාම්ප්‍රදායික පරිසර දැනුම තුළින් වර්තමානයේ පවා මිනිසාගේ පරිවාරයේ රැක ගැනීමට එම දැනුම ප්‍රයෝජනවත් වී ඇත.

a) ජනප්‍රවාදය

ඈත අතීතයේදී මෙම සුවපුබුදුගම වසම හඳුන්වා ඇත්තේ මූකලාන යන අන්වර්ථ නාමයෙනි. එනම් ජනප්‍රවාද අනුව රජවරුන්ට යාග හෝම කළ හෝමාගම ග්‍රාමයට පිටි පැත්තෙන් වූ වනය පිටිවනය වූ බවත් එය පසු කාලීනව පිටිපන වූ බවත් මෙම පිටිපන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් පහක් පුරා කිරිබේරියකැලේ, පිටිපන උතුර, පිටිපන දකුණ, ප්‍රසන්නපුර, සුවපුබුදුගම යන ග්රාමයන් පුරා විසිරුණු බවත් සඳහන් ය. මෙම ප්‍රදේශය විශාල මූකළන් කැලයක් වූ බවත් එහි කොටි වලසුන් වැනි සතුන් පවා සිටි බවත් ජනප්‍රවාද අනුව පැවසේ. යාග හෝම සඳහා දර සැපයූ ස්ථානය බවටත් මෙම වසම මූකලාන ලෙස ප්‍රසිද්ධ වීමට හේතු වී තිබේ. තවද මෙම සුවපුබුදුගම වසම පිළිබඳව තවත් ජනප්‍රවාද කිහිපයක් ඇති අතර ඒවා පෘතුගීසි යුගය දක්වා දිවයයි. එනම් එක් සොල්දාදුවකු ලුහුබැඳ යාමේදී ඔහු අල්ලා බලන විට පිටේ පණ තිබූ නිසා පිටිපන වූ බවද තවත් තැනක සඳහන් වේ. මෙම කතා වර්ථමානයේ දී ද ඉතා රසවත් ජනකතා ලෙස ගැමි වහරේ පැවතීමෙන් ඉතා වටිනා ඓතිහාසික ජනප්‍රවාද මෙම වසම හා සම්බන්ධ බව පැවසීමට හැකිය.

එසේම පරිසරය සම්බන්ධ ජනප්‍රවාද නිසා ;

- ✓ රත්ගස්, නා ගස්, බෝ ගස් කපා විනාශ කළ විට ආපදා සිදුවන බවට වූ ජනප්‍රවාද නිසා විශාල වටිනාකම් සහිත ශාකවලට හානි නොකිරීමට මිනිසුන් වග බලා ගත් අතර ඒ තුළින් පරිසරය සුරැකීම සිදුවිය.
- ✓ ඇළ, දොළ, ගංගාශ්‍රිතව ජලයට අධිපති දෙවියන් වැඩ හිඳිනා බවට වූ ජනප්‍රවාද හේතුවෙන් ඒවා අපවිත්‍ර කිරීමට මිනිසා නොපෙළඹවීම නිසා පරිසරය ආරක්ෂා වීම.
- ✓ හිරු දෙවි නමස්කාරය
- ✓ වැහි ලිහිනීන් පියාසර කිරීම, මෙරුන් මතුවීම තුළින් වර්ෂාව ලැබෙන බව පැවසීම.

මේවා වර්තමානයේදී ද පරිසරයට, සමාජයට අදාළ කර ගනිමින් දිවි ගෙවීමට නවක පරපුර පවා පෙළඹී තිබේ.

b) ජනශෘතිය

ජන ජීවිතයට අදාල අත්දැකීම්, විශ්වාස, අදහස්, රීති සහ කතාමාලා මීට අයත්ය. ජනකවි, ජනකතා, ජන විශ්වාස, රීති ආදිය පරපුරෙන් පරපුරට පැවත ඒම තුළ බොහෝ නවක පිරිස් පවා ඒවාට ගරු කරමින් පරිසරය සුරැකීමට දායක වී තිබේ.

c) දේශීය වෛද්‍ය ක්‍රමය

සාම්ප්‍රදායික පරිසර දැනුම හා පරිවාරය සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය ක්‍රමයේ බලපෑම ඉතාමත්ම ඉහළ මට්ටමක පවතී.

- ✓ එනම් දේශීය වෛද්‍ය මතයට අනුව සිංහල - හින්දු අලුත් අවුරුදු සැමරීමේදී විශේෂයෙන් සූර්යයාගේ බලපෑමෙන් තොරව මිහිපිට කිසිවක් කළ නොහැකි යන්න සනාථ කරමින් සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට ගමන් කිරීමේදී සූර්යයාගේ බලපෑම අපට නොලැබෙන පුණ්‍ය කාලයේදී ආහාර ගැනීමට නුසුදුසු බව චාරිත්‍ර චාරිත්‍රවලට ඇතුළත් කොට පරිසරයට අනුගත වීමට මිනිසා පොළඹවා තිබීම පෙන්වා දිය හැකිය.

- ✓ එසේම බක් මාසයේදී සූර්යා මුදුන්ව ගමන් කිරීම තුළ උෂ්ණාධික කාලයක් බැවින් කිරිබත්, කැවිලි ආහාරයට ගැනීම නානු ගා හිස තෙල් ගෑම වැනි චාරිත්‍රවලින්ද ඒ බව තහවුරු වේ.

- ✓ සිංහල අයුර්වේද වෛද්‍ය ක්‍රමය පරිසරය හා බැඳී පවතින තත්ත්වය කෙසේ ද යත් වෛද්‍ය ක්‍රමය තුළ නිෂ්පාදනය කරන සියලුම ඖෂධ වර්ග අප අවට පරිසරයේ ඇති ගහ කොළ, සතා සිවුපාවාට පිං සිදු වන්නට සාදා ගනී. ගස් වල පස් පංගුව ශාකයන්ට හානි නොකරමින් ලබා ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

- ✓ එසේම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් රුක් රෝපණ වැඩසටහන් හා ඖෂධ උයන් නිර්මාණය කිරීම තුළ පරිසරයට අලංකාරයක් මෙන්ම දේශීය වෛද්‍ය විද්‍යාවට ද පිටිවහලක් වීම.

III. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය

මිනිසුන් තම ජීවිතය ගතකරන ආකාරය පරිසරට අනුකූල කර ගත් අයුරු මින් විස්තර කෙරෙන අතර දීර්ඝ කාලීනව එකම භූගෝලීය පරිසරයක ජීවත් වීම තුළ එම පරිසරය මත රැඳී තම ජීවිතය ගොඩනඟා ගත් කණ්ඩායම් ජන කණ්ඩායම් වේ.

✓ වැදි ජනතාව වනය, සතුන්, ගහ කොළ මුල් කරගනිමින් වනාන්තර ආශ්‍රිතව ජීවත් වීම.

✓ ගොවි කණ්ඩායම් අහස දෙස බලමින්, සතුන්ගෙන් අනාවැකි බලමින් කෘෂි කර්මාන්තයේ යෙදීම.

✓ ධීවර ජනතාව මුහුද ආශ්‍රය කරගෙන ජීවන රටා ගොඩනගා ගැනීම.

IV. පරිසර ගැටලු සඳහා යෙදුණ විසඳුම් හා විකල්ප

පරිසර ගැටළු සඳහා යෙදිය හැකි විසඳුම් හා විකල්ප බොහෝ ඇති අතර ඒවා පාරිසරික ගැටළුවේ ස්වභාවය අනුව වෙනස් වේ.

ගැටළුව	විසඳුම්	විකල්ප
1. වායු දූෂණය	★ නගර ප්‍රවාහන පද්ධති සංවර්ධනය කිරීම. ★ කුඩා කර්මාන්තවල දුම් හා දූෂණ පාලනය කිරීම ★ නව කාර්යාල හා නිවාස වල කාබන් භාවිතය අවම කිරීම	★ පුනර්ජනනීය ශක්ති ප්‍රභව හඳුන්වා හඳුන්වා දීම. ★ සෞඛ්‍ය පූර්ණ ගමනාගමනය (විදුලි බයිසිකල් / විදුලි රථ)
2. ජල දූෂණය	★ අපද්‍රව්‍ය ජලයට මුදා හැරීමට පෙර ප්‍රතිචක්‍රීකරණය කිරීම. ★ කෘෂිකර්මාන්තයේදී රසායනික පොහොර හා පීඩක භාවිතය පාලනය කිරීම.	★ ජලය පිරිසිදු කිරීම් කාරක නවීන හා සාම්ප්‍රදායික යන දෙයාකාරයටම භාවිතය. ★ පාසල් දරුවන්, විශ්වවිද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොමු කරවීම. ★ රසායනික පොහොර වෙනුවට වැඩිපුර කාබනික පොහොර හඳුන්වා දීම. ★ ජලය පිරිසිදු කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රම සොයා ගැනීම.
3. භූමි හා වන විනාශයන්	★ වනාන්තර රැකවරණ නීති දැඩිව ක්‍රියාත්මක කිරීම. ★ ඉඩම් භාවිත සැලසුම් නිවැරදි කිරීම.	★ අලුත් තාක්ෂණය යොදා ගත් නගර සංවර්ධනය කිරීම. (Green City) ★ සරුබිම් ආරක්ෂා කිරීමට ජෛව විවිධත්වය රැක ගැනීම' ★ ගම් මට්ටමෙන් රුක් රෝපණ ව්‍යාපෘති දියත් කිරීම.

		★වගාකරුවන් දිරිමත් කිරීම සඳහා තරඟ / ත්‍යාග වැනි උපක්‍රම භාවිතය.
4. අපද්‍රව්‍ය ගැටලුව	★ 3R ක්‍රමය භාවිතයට (නැවත භාවිතය, භාවිතය අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම) පාසල් ළමුන්, ස්වේච්ඡා සංවිධානවල සාමාජිකයන්, දැනුවත් කිරීම.	★ ජෛව ඉන්ධන සෑදීම
	★ අපද්‍රව්‍ය වෙන් කිරීම.	★ කාබනික අපද්‍රව්‍ය ශක්ති පොහොර බවට පත් කිරීම.
	★ අපද්‍රව්‍ය පාලන නීති (ප්‍රාදේශීය සභා මඟින් අපද්‍රව්‍ය එකතු කිරීම)	★ නව තාක්ෂණික නිෂ්පාදන බිහිකිරීමට ගම් මට්ටමේ ව්‍යවසායකයින් පුහුණු කිරීම. (ප්ලාස්ටික් වෙනුවට කඩදාසි බෑග්, පරිසර හිතකාමී ඇසුරුම් ආදී)
	★ පිරිසිදු කිරීමේ වැඩසටහන් දියත් කිරීම.	★ අඩු වියදමින් ගොවිතැනට විසඳුම් සෙවීමට ගොවී අපද්‍රව්‍ය, කොම්පෝස්ට් කර භූමියට නැවත යොදා ගැනීම.
		★ ආරම්භක මට්ටමේ අධ්‍යාපන වැඩසටහන් මඟින් දරුවන්ට පරිසර හිතකාමී දැනුම, ප්ලාස්ටික් අඩු කිරීම පිළිබඳ දිරිගැන්වීම.

6. කාලීන පරිසරික අර්බුද හා අභියෝග

	අර්බුදය	අභියෝගය	විස්තරය / බලපෑම
I	වන විනාශය	★ ජෛව විවිධත්වය අහිමිවීම. ★ වනාන්තර ආරක්ෂා කර ගැනීම.	★ සතුන් හා ශාක විශේෂ විනාශ වීම, කාබන් අවශෝෂණය අඩුවීම, ගංවතුර වැඩිවීම, කාබනික ගැටලු වැඩිවීම.

	කැලෑ එළි කිරීම	★ ඉඩම් භාවිතය පිළිබඳ නියමයන් ★ නගර සංවර්ධනය	★ නව නිවාස තැනීමට, ගොවිතැන් හා කම්මල් ඉදිකිරීමට, භූමිය විනාශ කිරීම, පරිසර පද්ධතිය විකෘති වීම පෙන්වා දිය හැක. ජනගහනයේ අධික වීම හේතුවෙන් මෙම තත්ත්වය උදාවී ඇත.
II	ජල හිඟය	★ ජල සම්පත් කළමනාකරණය කර ගැනීම, පානීය ජල හිඟය	★ ගොවිතැන් සඳහා ජල සම්පත් හිඟවීම, පානීය ජල සම්පාදනය අඩුවීම ප්‍රධාන වේ. ★ ජලය වෙනුවෙන් පවතින තරඟය වැඩි වැඩි වීම ද (භාවිතය වැඩි නිසා) පෙන්වා දිය හැකිය.
III	පාංශු භායනය	★ භූමියේ සාරවත් බව සුරක්ෂිත කිරීම. ★ ගොවිතැන් ආරක්ෂා කිරීම.	★ කෘෂි භූමි වියළී යාම. ★ අධික පොහොර භාවිතය ★ කෘෂිකාර්මික ආදායම් අඩුවීම.
IV	කැලි කසල බැහැර කිරීම	★ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ★ප්ලාස්ටික් භාවිතය අවම කිරීම	★ නාගරිකව පිරිසුදු බව අඩුවී සෞඛ්‍ය ගැටලු ඉතා ඉක්මනින් වර්ධනය වීම සිදුවේ.
V	දේශගුණික විපරයාසවල බලපෑම	★ ආහාර වල ආරක්ෂිත බව රැකීම ★ජීවිතවල ආරක්‍ෂාව තහවුරු කිරීම	★ වියලි කාලගුණය, ගංවතුර, සුළි කුණාටු, ගොවිතැන හා මිනිස් ජීවිත මත බලපෑම් කරනු ලැබීම තුළ ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වේ.
VI	ආගන්තුක හා ආගන්තුක - ආක්‍රමණශීලී විශේෂවල බලපෑම	★ ස්වදේශීය ශාක හා සත්ව කොටස් විනාශ කරයි. ★ ජෛව විවිධත්වය අඩුකරයි ★ ආහාර ජාල ක්‍රමය කඩ කරයි ★ කෘෂිකර්මාන්තයට හානි සිදුකරයි	★ආගන්තුක ආක්‍රමණික ශාකවල පාලනය සඳහා විශාල වශයෙන් මුදල් වැය කිරීමට සිදුවෙයි

7. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කර ගැනීම

	අරමුණ	අභියෝග	විසඳුම්
I	**අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව**		
	★ සෑම මිනිසෙකුටම පිරිසිදු පානීය ජලය සහ සුදුසු සනීපාරක්ෂක පහසුකම් ලබාදීම.	★ ජලය දූෂණය වීම.	★ ජලය පිරිසුදු කිරීමේ නව තාක්ෂණ ක්‍රම සොයා ගැනීම සහ භාවිතය.
		★ වියලි කාලවලදී ජලය හිඟවීම.	★ ගම්මානවලට ජල සම්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
		★ ජලය පිරිසිදු කර ගැනීමට ඇති අපහසුකම.	ජලය කාර්යක්ෂම ලෙස අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.
II	**අභිමතාර්ථ අංක 07 - ධරණීය සුනිත්‍ය බලශක්තිය**		
	★ සෑම පුද්ගලයෙකුටම අඩු වියදමින් හිතකාමී බලශක්ති ක්‍රමයක් ලබාදීම	★ තවමත් රටවල ජාතික ආර්ථිකය ඉන්ධන හෙවත් ගල් අඟුරු, තෙල්, ස්වභාවික ගෑස් ආදීය වැඩි වශයෙන් භාවිතා කිරීම තුළ කාබන් වායු ඉහළ යාම.	★ පුණර්ජනනීය ශක්ති සඳහා උපකරණ / ණය පහසුකම් ලබාදීම.
		★පුනර්ජනනීය ශක්ති පද්ධති වියදම එනම් සූර්යය පැනල, සුළං විදුලි බලය, විදුලි ග්‍රිඩ් පද්ධති සඳහා අධික මිලක් වැය වීම.	★ නව තාක්ෂණය සංවර්ධනය කිරීම.
		★ ශක්ති සම්පත් සමාන නොවීම.	★ ජාත්‍යන්තර එකමුතුවෙන් ශක්තීන් හුවමාරු කර ගැනීම.
		★ නව ශක්ති ප්‍රභව සඳහා නීතිකරණය අදාල නීති සම්පාදනය සීමිත වීම. පරිසර දූෂණය. විදුලි හිඟය.	
III	**අභිමතාර්ථ අංක 12 - තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්**		

	★ සම්පත් වියදම අඩු කරමින් අපද්‍රව්‍ය අඩු කරන නිෂ්පාදන හා පරිභෝජන ක්‍රම හඳුන්වාදීම.	★ ප්ලාස්ටික් නොදිරන ද්‍රව්‍ය වැඩිවීම. ★ විශාල අපද්‍රව්‍ය එකතුවීම.	★ පරිසර හිතකාමී නිෂ්පාදන ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයන්ට හඳුන්වා දීම තුළින් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිය. ★ 3R ක්‍රමය ළමා සමාජ, දහම් පාසල්, ස්වේච්ඡා සංවිධාන හරහා සමාජගත කිරීම. ★ පාසල් ශිෂ්‍යයන් හා ගුරුවරුන් අතර ඇති ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රමයක් වන වටාපටා ක්‍රමය තුළින් දරුවන් සජීවී ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා යොදාගෙන පරිසර හිතකාමී වැඩසටහන් මගින් පරිභෝජන හා නිෂ්පාදන රටා හඳුන්වාදීම.
IV	**අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස සහ ඒවායේයේ බලපෑම**		
	★ වියළි කාලගුණ තත්ත්වයන්, සුළි කුණාටු වැනි දේශගුණික විපර්යාසයන්ට මුහුණ දිය හැකි ආරක්ෂිත සමාජයක් ගොඩනැගීම.	★ අධික ජනගහන වර්ධනයත් සමග කර්මාන්ත ගමනාගමනය වැඩිවීම නිසා කාබන් ඩයොක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ් වැනි වායු පිටවීම නිසා කාබන් සණ වායුව අඩුකිරීම.	★ ගංවතුර, සුළි කුණාටු, වියළි කාලගුණික තත්ත්වයන්ට පෙර සූදානම් වීම.
	★ කාර්මික, ගමනාගමන, ශක්ති, කෘෂි ක්ෂේත්‍රයන් භාවිතයේදී කාබන් වැනි වායූන් අවම වන පරිදි තිරසාර මහකට ගැනීම.	★ වියලි කාලගුණය නිසා කෘෂිකර්මාන්තයට හානි වීම තුළ ආහාර අර්බුදය හට ගැනීම.	★ ප්‍රජා මූල විපත් කළමනාකරණය.
	★ ගෝලීය උෂ්ණත්වය වැඩි කිරීම කෙරෙහි බලපාන දේශගුණික විපර්යාස මඟින් ඇති කරන බලපෑම් අවම කර ගැනීම.	★ සුළි කුණාටු, මූල්‍ය ආර්ථික බර වැනි වගකීම් නිසි ලෙස ඉටු නොවීම.	★ දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත් කිරීම. ★ රුක් රෝපණය තුළින් වන වගා ආරක්ෂා කර ගැනීම ★ ගොවිතැන සඳහා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.

			★ අහිතකර වායු මුදා හරින කර්මාන්ත නවීකරණය කිරීම. ★ කාබන් බද්ධ හෝ වෙළඳපළ හඳුන්වාදීම. ★ නව ශක්ති මූලාශ්‍ර හඳුන්වාදීම ★ Paris Agreement වැනි ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ★ දුප්පත් රටවලට මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීම.
V	**අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම් දායක වීම**		
	සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම් දායකවීම වසමට අදාළ නොවේ.		
VI	**අභිමතාර්ථ අංක 15 - භූමි පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතාව**		
	★ මිනිස් අවශ්‍යතා වන නිවාස, කෘෂිකර්මාන්තය, වෙනත් කර්මාන්ත හා පරිසරය රැකගැනීම අතර සමබරතාවයක් තිබිය යුතුය.	★ ගොවි කර්මාන්තය සඳහා රසායනික පොහොර භාවිතය තුළින් පස හා ජලය දූෂණය වීම.	★ ඉදිරි පරපුර වෙනුවෙන් රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
	★ පස හා ජල සම්පත තිරසාරව භාවිතා කිරීම.	★ නාගරිකරණය හා කර්මාන්ත සංවර්ධනය හේතුවෙන් ඉඩම්වල මිල අධික වීම.	★ පාංශු ඛාදන හා පාංශු හායන තත්වයන් වළකාලන පිළිවෙත් එනම් වැටි, තාප්ප ආදිය යොදා අවම කිරීම.
	★ ජෛව විවිධත්වය රැක ගැනීම.	★ සත්ත්ව හා ශාක විනාශ වීම තුළ ජෛව විවිධත්වය අහිමි වීම.	★ ගස් කැපීම් හා ඉඩම් භාවිත නීති දැඩි කිරීම සහ දඬුවම් ලබාදීම.

	★ දේශගුණික විපර්යාස හේතුවෙන් වන අයහපත් ප්‍රතිඵල, පාංශු ඛාදන හා පාංශු හායන තත්ත්වයන් මග හරවා ගෙන සත්ව ජීවිත ආරක්ෂාව සිදු කරගත යුතුය.	★ අධික ජනගහන වර්ධනය වීම හේතුවෙන් ඉඩම් අවශ්‍යතාවය වැඩිවීම. ★ නීති හා ප්‍රතිපත්තිවල දුර්වලතාවය.	

8. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්, යෝජනා හා නිර්දේශ

❖ <u>නව අදහස්</u>

✓ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය තුළින් පරිසරය හිතකාමී තෝතැන්නක් ලෙසට සකස් කරමින් හරිතමය ආර්ථිකයක් කෙරේ පරිවර්තනය කළ යුතුය. එවිට සංචාරක කර්මාන්තය, හරිත රැකියා, පරිසර ආයතන බිහිවීම නිසා යම් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිය.

✓ නැවත භාවිතය, භාවිතය අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම යන 3R සංකල්පය මත පදනම්ව සම්පත් පරිහරණය කිරීම තුළින් චක්‍රීය ආර්ථික (Circular Economy) තත්ත්වයක් ඇති කිරීම සුදුසුය.

✓ වැහි වතුර ගබඩා කිරීමෙන්, සූර්ය පැනල භාවිතය තුළින්, ජල ප්‍රවාහන රටා යොදා ගනිමින් නගර සැලසුම් කළ යුතුය

✓ ග්‍රාමීයව, ප්‍රජා මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති දියත් කළ යුතුය.

✓ AI භාවිතයෙන්,Video Camera භාවිතයෙන්, දුරස්ථපාලක යොදා ගනිමින් නිරන්තරයෙන් පරිසරය නිරීක්ෂණයට ලක් කළ යුතුය.

❖ <u>යෝජනා හා නිර්දේශ</u>

✓ පාසල් විෂය නිර්දේශය සඳහා පරිසර හිතකාමී අධ්‍යාපන ක්‍රමවේද ඇතුළත් කිරීම තුළින් ප්‍රායෝගිකව දරුවන් පරිසරය හා සම්බන්ධ කර දරුවන් සහ පරිසරය බද්ධ කිරීම.

- ✓ සියලුම ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් පරිසරය සුරැකීම සඳහා අරමුදලක් පිහිටුවීම.
- ✓ සෑම නිවසකම පාහේ පැල සිටුවීම සඳහා නිවැසියන් පෙළඹවීම.
- ✓ ගොවීන්ට රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර යෙදීම සඳහා යොමු කරවීම තුළින් පරිසර දූෂණය වළක්වා ගැනීම.
- ✓ රජය හා පෞද්ගලික අංශ එකතු වීම තුළින් තිරසාර පරිසර ව්‍යාපෘති ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදු කිරීම.

9. ඇමුණුම්

I. සිතියම්

ඇමුණුම් 01 හා ඇමුණුම් 02

II. රූප සටහන්

III. ප්‍රජා සහභාගිත්ව පර්යේෂණ / සමීක්ෂණ

484E සුවපුබුදුගම ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතියේ සාමාජිකයින් කිහිප දෙනෙක් සහ වසම පිළිබඳව පොතක් ලියූ ප්‍රවීණ ලේඛක පියසිරි මාතරගේ මහතා ඇතුළු ගමේ වැඩිහිටියන් කීප දෙනෙකුගෙන් යුත් කුඩා කමිටු රැස්වීමක් තුළින් සාකච්ඡා කර ලබා ගන්නා ලද වසම පිළිබඳ ජනප්‍රවාද, ජනශ්‍රැති හා ඉතිහාස කටකතා සහ මෙම වසමේ පෙර තත්ත්වය පිළිබඳව කරුණු විමසන ලදි.

10. විමර්ශන

I. ජනගහනය - 2024 සම්පත් පැතිකඩ සහ 2024 නිවාස සංගණනය සඳහා රැස්කළ තොරතුරු මඟින්

II. දේශගුණික තොරතුරු - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ Weather Spark වෙබ් අඩවිය තුළින්

III. භෞමික සම්පත් තොරතුරු - වසමේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර ගෙන් ලද තොරතුරුසහ අන්තර්ජාලය තුළින්

IV. ශාක ලේඛනය - Food Gate සමීක්ෂණ වාර්තා මගින්

V. සිතියම් - අන්තර්ජාලය තුළින් උපුටාගෙන ඇත.

11. වසම පිළිබඳව

484E සුවපුබුදුගම ග්‍රාම නිලධාරී වසම කුඩා වපසරියකින් යුත් 1.206 km2 ක පමණ ප්‍රදේශයක් පුරා විහිදී ගිය ග්‍රාමීය වසමකි. ජනගහනය, පුද්ගලයින් 3076 ක් පමණ වන අතර සිංහල ප්‍රජාවට අමතරව දෙමළ, මුස්ලිම් ප්‍රජාවද සුළු ප්‍රතිශතයක් වාසය කරති. කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් වැඩි පිරිසක් වන අතර සුළුතරයක් වූ රාජ්‍ය සේවක ප්‍රමාණයක් ද පුද්ගලික සේවයේ රැකියා කරන්නන් ද මෙහි සිටිති. අනෙකුත් වසම් හා ගත් කල කම්කරු රැකියා කරන බොහෝ පිරිසක් වෙති. ස්වයං රැකියා ලාභීන්ද සුළු ප්‍රමාණයක් සිටිති. ස්වභාවික සම්පත් මෙහි කිසිවක් නොමැති අතර පාරිසරික වශයෙන් විශාල ගැටලූ සහගත තත්ත්වයක් ද මෙහි දක්නට නොමැත.


ND Motors
2nd Ln
Vivekarama Rd
Hampton Ct


Vivekarama Rd
ND Motors
2nd Ln
Methsiri Arama
Sunethradevi dharmayatha
P කුඹුරු
පො පොල්
ගෙවතු
R රබර්
C කුරුඳු